**ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම්, අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 31 දින ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම්, අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

ශ්‍රී ලංකා රේගුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 2,056.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,979.79 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා රේගුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 76.21 ක් හෙවත් සියයට 3.69 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,956.00 | 1,892.73 | 63.27 | 3.23 |
| මූලධන | 100.00 | 87.06 | 12.94 | 12.94 |
| එකතුව | 2,056.00 | 1,979.79 | 76.21 | 3.69 |

**2.2** **ආදායම් ගිණුම්**

**----------------**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්**

**---------------------------------------**

ශ්‍රී ලංකා රේගුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේත 16 ක් සඳහා එකතුව රු.මිලියන 700,980.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 699,872.71 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 99.84 ක් විය. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම/ (ඌනතාවය) ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10.01.01.00 | 160, 000.00 | 156,487.11 | (3,513.89) | (2.19) |
| 10.01.02.00 | 300.00 | 31.25 | (268.75) | (89.67) |
| 10.01.04.00 | 90,000.00 | 88,822.93 | (1,177.07) | (1.31) |
| 10.01.05.01 | 55,000.00 | 59,058.38 | 4,058.38 | 7.38 |
| 10.01.05.02 | 2,000.00 | 2,672.01 | 672.01 | 33.6 |
| 10.01.06.00 | - | - | - | - |
| 10.01.07.00 | - | 0.87 | - | - |
| 10.01.08.00 | 58,000.00 | 55,825.12 | (2,174.88) | (3.75) |
| 10.01.99.00 | - | - | - | - |
| 10.02.05.01 | 90,000.00 | 88,751.72 | (1,248.28) | (1.39) |
| 10.02.05.02 | 50.00 | - | - | |
| 10.02.05.03 | 50,000.00 | 55,719.12 | 5,719.12 | 11.44 |
| 10.02.05.04 | 190,000.00 | 186,499.20 | (3,500.80) | (1.84) |
| 10.02.05.99 | 4,000.00 | 3,703.56 | (296.44) | (7.42) |
| 20.03.02.17 | 130.00 | 167.13 | 37.13 | 28.46 |
| 20.03.03.01 | 1,500.00 | 2,134.25 | 634.25 | 42.27 |

**2.3.** **අත්තිකාරම් ගිණුම්**

**-------------------**

**2.3.1** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**-------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**-------------------------------------------------**

ශ්‍රී ලංකා රේගුවට අදාල විෂය අංක 24701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 38.00 | 37.90 | 36.00 | 52.30 | 300.00 | 187.50 |

### 2.3.2 අත්අඩංගුවට ගත් හා රාජසන්තක කළ බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකා රේගුවට අදාලව අත්අඩංගුවට ගත් හා රාජසන්තක කළ බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය සීමාව | අවම සීමාව | තථ්‍ය සීමාව | උපරිම සීමාව | තථ්‍ය සීමාව |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 6.00 | 4.60 | 1.00 | 3.10 | 34.00 | 28.10 |

### 2.4 අග්‍රිම ගිණුම

ශ්‍රී ලංකා රේගුවේ 2016 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0071/0016/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 1.37 ක් විය.

### 2.5 පොදු තැන්පත් ගිණුම්

ශ්‍රී ලංකා රේගුව යටතේ වන තැන්පත් ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට පැවැති ශේෂ එකතුව භාණ්ඩාගාර පොත් අනුව රු.මිලියන 10,970.69 ක් විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0018/0128/000 | 10,829.62 |
| 6000/0000/00/0002/0186/000 | 135.92 |

| | |
|---|---|
| 6000/0000/00/0001/0035/000 | 5.15 |
| | ------------ |
| **එකතුව** | **10,970.69** |
| | ======= |

**2.6 විගණන නිරීක්ෂණය**

-------------------------

ශ්‍රී ලංකා රේගුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම්, අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---------------------------------------------------

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

----------------------------------------------

මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව විසින් බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

**3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 272 (3) ප්‍රකාරව එකතුව රු.මිලියන 86.89 ක වටිනාකමකින් යුතු ගෙවීම් වවුචර්පත් 31 ක් මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද අදාල චෙක්පත ලියන ලද දිනයේ සිට මාස 06 ඉක්ම වූ රු.මිලියන 11.64 ක වටිනාකමක් සහිත වවුචර් 08 ක්ද ඒ අතර වූ බව නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂ 12 ක කාලපරිච්ඡේදය තුල රජයේ ආදායමට බැරකර තිබූ එකතුව රු.මිලියන 17,969.89 ක් වූ දණ්ඩන හා විකුණුම් ආදායමින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට තවදුරටත් ආපසු ගෙවිය යුතු වටිනාකම පිළිබඳ විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

**3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

---------------------------------------

විගණන විමසුම් 48 ක් සඳහා පිළිතුරු ලබාදීම සඳහා මාස 1 සිට මාස 12 දක්වා වූ කාල ප්‍රමාදයක් පැවති බව නිරීක්ෂණය විය.

**3.4 විසර්ජන ගිණුම**

-------------------

**3.4.1 අනිවාර්ය ඉතිරි කිරීම්**

-----------------------

2015 දෙසැම්බර් 29 දිනැති අංක 07/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2 ඡේදය මඟින් 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල ඉන්ධන වැය විෂයය සඳහා වූ වාර්ෂික ප්‍රතිපාදනයෙන් සියයට 15 ක් හා ප්‍රවාහන සඳහා වූ වැය විෂයයේ වාර්ෂික ප්‍රතිපාදනයෙන් සියයට 10 ක් අනිවාර්යයෙන්ම ඉතිරි කල යුතු බවට උපදෙස් ලබාදී තිබුණි. එහෙත් ශ්‍රී ලංකා රේගුව විසින් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා එම වැය විෂයයන් වෙනුවට ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා සහ විදුලිය හා ජලය යන

වැය විෂයයන් 02 යටතේ අදාල ඉතිරි කිරීම් සිදුකර තිබුණි. මෙම තීරණ නිසා රාජ්‍ය වියදම් කළමනාකරණය සඳහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබුණු යථෝක්ත චක්‍රලේඛයේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

### 3.4.2 අයවැය විචලනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තීරු බදු ආපසු ගෙවීම් වැය විෂයය යටතේ රු.මිලියන 10.00 ක ප්‍රතිපාදන සළසාගෙන තිබුණද, එම ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 10 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 සිට සියයට 76 දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) දේශීය ගමන් වියදම් වැය විෂයය සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.මිලියන 45.00 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ඉන් සියයට 20 ක් වූ රු.මිලියන 9.00 ක් ඉතිරි වී තිබුණි. තවද වර්ෂ අවසානයේ නොගෙවා තිබූ ගමන් වියදම්වල එකතුව රු.3,668,828.00 ක් බව නිරීක්ෂණය විය. එය පියවූ පසු තවදුරටත් රු.මිලියන 5.00 ක හෙවත් සියයට 11 ක ඉතිරියක් පවතින හෙයින් ඇස්තමේන්තු තාත්වික පදනමක් මත පිහිටා පිළියෙල කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(ඈ) විදුලිය හා ජලය වැය විෂයය යටතේ 2015 වර්ෂය සඳහා තථ්‍ය වියදම රු.මිලියන 129.00 ක් වුවද, 2016 වර්ෂය සඳහා මූලික ඇස්තමේන්තුව මගින් රු.මිලියන 150.00 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබූ අතර ඉන් රු.මිලියන 19.50 ක් මුදල් රෙගුලාසි 66 අනුව වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. එම වැය විෂයයන් යටතේ තවදුරටත් රු.මිලියන 9.00 ක ඉතිරිවීම් වාර්තා වී තිබුණි.

### 3.5 අග්‍රිම ගිණුම්

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10 ක් ඇතුලත එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද ශ්‍රී ලංකා රේගුව විසින් අවස්ථා 15 කදී ලබා දී තිබූ එකතුව රු.1,330,000 ක් වූ අග්‍රිම ශේෂ පියවා තිබුණේ අදාල කාර්යය නිමවී දින 51 සිට දින 276 ක් දක්වා වූ කාල පරාසයක ප්‍රමාදයකින් පසුවය.

(ආ) 2015 ජුලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2015 න් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිමය රු.100,000 ක සීමාව ඉක්මන අවස්ථාවලදී ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය විධිමත්ව ලබාගත යුතු වුවත්, රු.2,021,000 ක් වටිනා ගෙවීම් සඳහා එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) නිලධාරීන් 26 දෙනෙකු වෙත ලබාදී තිබුණු අතුරු අග්‍රිමවලින් අත ඉතිරිව පැවති රු.966,809 ක මුදලක් දින 20 සිට දින 64 දක්වා වූ කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි.

**3.6 තැන්පත් ගිණුම්**

**------------------**

(අ) **අංක 6000/0000/00/018/0128/000 දරන ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා වූ තාවකාලික තැන්පත් ගිණුම**

**-----------------------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) තැන්පත් ලෙජරවල තුලන ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර එක් එක් වර්ෂය සඳහා පොදු 71 ආකෘති පත්‍රයේ පිළියෙල කරන මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2010 ජුලි 12 දිනැති අංක 209/2010 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4.3 (1) ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තැන්පතු ලෙජරවල 2016 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂ දක්වා නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 565 (1) 4 වගන්තිය ප්‍රකාරව තැන්පත් ලෙජරවල ආරම්භක ශේෂයන් සටහන් කර නොතිබුණි.

(ආ) **අංක 6000/0000/00/0001/0035/000 දරන ගුවන් මඟින් රැගෙන යන භාණ්ඩ සඳහා අය කරනු ලබන තැන්පත් ගිණුම**

**-----------------------------------------------------------------------------------------------------**

2010 අප්‍රේල් 28 දිනැති අංක 696 දරන අභ්‍යන්තර චක්‍රලේඛය මගින් හඳුන්වාදී ඇති මෙම තැන්පතු ගිණුම සඳහා 2010 සිට 2016 දක්වා වූ වර්ෂ 07 ක කාල පරිච්ඡේදයකට අදාල ගිණුම් පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2017 අප්‍රේල් 28 දින දීය. එහෙත් එම ගිණුම් විගණනය සඳහා අවශ්‍ය ආනුශංගික සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවූ අතර ඒ සම්බන්ධයෙන් 2017 ජුලි 21 දින නිකුත් කර තිබුණු අංක PUR/B/CUS/2016/G/21 දරන විගණන විමසුමටද මෙම වාර්තාවේ දිනය දක්වාම පිළිතුරු ලැබී නොතිබුණි.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 වර්ෂයේ ආරම්භ කරන ලද ගිණුමට අදාලව ප්‍රථම වරට ගිණුම් ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2016 වර්ෂයේදීය. එයද 2015 වර්ෂය සඳහා පමණක් සකස් කර තිබුණි.

(ii) 2017 වර්ෂයේ නැවතත් 2015 වර්ෂයද ඇතුළත් වන ලෙස ගිණුම් ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබූ නමුත් ගනුදෙනු තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි ඒ සමඟ නොවීය.

(iii) ගිණුම් සම්බන්ධ සාක්ෂි විගණනය විසින් කිහිප අවස්ථාවකදීම ඉල්ලුම් කර සිටියද ශ්‍රී ලංකා රේගුව විසින් ඒ සඳහා සතුටුදායක ප්‍රතිචාරයන් දක්වා නොතිබුණි.

**3.7 ආදායම් ගිණුම්**

**-----------------**

දෙපාර්තමේන්තු ප්‍රධානියාට ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් ආදායම් සංකේත 16 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීම යනාදී කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව විසින් රැස්කරමින් තිබූ මත්පැන් නිෂ්පාදන බද්ද, 2002 මාර්තු 22 දිනැති අංක 1228/14 දරන මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් එදින දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර තිබුණි. එසේ අවලංගු කිරීමට පෙර, මත්පැන් නිෂ්පාදන ආයතනවලින් අයවිය යුතුව පැවති හිඟ බදු ආදායම්වලින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට තවදුරටත් රු.මිලියන 89.26 ක ශේෂයක් අයවිය යුතුව තිබුණි.

(ආ) 2012 අංක 07 දරන එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි සමාගම් විසින් දේශීය වෙළඳපොලට සපයනු ලබන ඇඟළුම් ඒකකයක් මත අයකරනු ලබන රු.25 ක් වූ බද්ද 2016 නොවැම්බර් 01 දිනැති 2016 අංක 20 දරන එකතු කල අගය මත සංශෝධිත බදු පනතින් ඒකකයට රු.75 ක් ලෙස සංශෝධනය කර තිබුණි. එහෙත් ශ්‍රී ලංකා රේගුව විසින් දෙපාර්තමේන්තු නියෝග අංක 116 යටතේ එය ක්‍රියාත්මක කර තිබුණේ 2017 ජුනි 14 වන දින සිට වන අතර මේ හේතුවෙන් අහිමි වී ඇති බවට විගණනය විසින් ගණනය කල බදු ආදායම රු.මිලියන 166.59 ක් පමණ විය.

(ඇ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම් අනුව එකතුව රු.මිලියන 21,315.80 ක ආදායම් හිඟහිට තිබුණි. විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු, අමාත්‍යාංශය අතර එකිනෙක වැය ශීර්ෂ හරහා පියවාගත යුතු හිඟ ආදායම් පියවා ගැනීම සතුටුදායක මට්ටමක නොවීම හේතුවෙන් පහත සඳහන් ආදායම් සංකේතයන්ට අදාලව හිඟ ආදායම් වර්ෂ ගණනාවක සිට හිඟ ආදායම් ලෙස වාර්තා ගත කර තිබුණි.

(i) 2016 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු ආදායමින් රු.මිලියන 6,811.71 ක් හෙවත් සියයට 31.96 ක ඉහලම අගය නියෝජනය කරන හිඟ ආනයන බද්ද 2015 වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 657.18 කින් හෙවත් සියයට 8.79 කින් අඩු වී තිබූ අතර රු.මිලියන 5,105.22 ක් හෙවත් සියයට 74.95 ක් 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල හිඟ හිටීම් විය.

(ii) 2015 දෙසැම්බර් 31 දිනට වරාය හා ගුවන්තොටුපල සංවර්ධන හිඟ බදු ආදායමින් රු.මිලියන 512.64 ක් හෙවත් සියයට 16.44 ක් සමාලෝචිත වර්ෂය තුලදී අයකරගෙන තිබූ අතර එලෙස අයකරගෙන ඇත්තේ 2014 හා 2015 සඳහා හිඟ බදු ආදායම් බව නිරීක්ෂණය විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 21,315.80 ක්වූ සමස්ථ හිඟ බදු ආදායමින් සියයට 12.23 ක් හෙවත් රු.මිලියන 2,606.35 ක් වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු ආදායම නියෝජනය කරනු ලබන අතර ඉන් සියයට 92.00 ක් හෙවත් රු.මිලියන 2,390.07 ක් 2006 වර්ෂයේ සිට 2012 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව හිඟ බදු ආදායම් බව නිරීක්ෂණය විය. එම හිඟ බදු අයකර ගැනීමේ මන්දගාමී බවක් නිරීක්ෂණය විය.

(iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු ආදායම වන රු.මිලියන 21,315.80 න් සියයට 6.65 ක් හෙවත් රු.මිලියන 1,418.20 ක් හිඟ ආනයන සෙස් බදු ආදායම නියෝජනය කරනු ලබන අතර ඉන් 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව රු.මිලියන 1,336.10 ක හිඟයක් පැවතුණි. එය සමස්ථ හිඟ ආනයන සෙස් බදු ආදායමින් සියයට 94.21 ක් විය.

(iv) 2011 වසරේදී අහෝසි කරන ලද ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද යටතේ 2011 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 42.42 ක හිඟ බදු ආදායමක් අයවීමට තිබූ අතර 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල ඉන් අය වී තිබුණේ රු.මිලියන 9.02 ක් පමණි. එය ප්‍රතිශතයක් ලෙස හිඟ බදු ආදායමින් සියයට 21.27 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තවදුරටත් රු.මිලියන 33.40 ක් අයවිය යුතුව පැවති අතර එම රු.මිලියන 33.40 වර්ෂ 2006 සිට වර්ෂ 2012 දක්වා කාලපරිච්ඡේදයට අදාලව හිඟ හිටව පැවතුණි.

(v) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3,598.06 ක් වූ හිඟ විශේෂ වෙළඳ භාණ්ඩ බදු ආදායම තුල වර්ෂ 2006 සිට වර්ෂ 2012 කාලපරිච්ඡේදයට අදාලව රු.මිලියන 15.12 ක හිඟ බදු ආදායමක් පැවතුණි. එසේම 2016 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු ආදායම වූ රු.මිලියන 21,315.80 න් හිඟ විශේෂ වෙළඳ භාණ්ඩ බදු ආදායම සියයට 16.88 ක් නියෝජනය කරන බව නිරීක්ෂණය කරන ලදි.

(vi) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 21,315.80 ක සමස්ථ හිඟ බදු ආදායමින් රු.මිලියන 89.26 ක් හෙවත් සියයට 0.42 ක් හිඟ මත්පැන් නිෂ්පාදන බදු ආදායම වේ. එම හිඟ මත්පැන් නිෂ්පාදන බදු ආදායම අදාල සමාගම විසින් ගෙවීම් පැහැර හැරීම නිසා 2001 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති ශේෂයක් වන අතර ශ්‍රී ලංකා රේගුව විසින් අදාල සමාගමට එරෙහිව නඩු පවරා තිබුණි.

(vii) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ හිඟ ඛණිජ තෙල් නිෂ්පාදන බදු ආදායම රු.මිලියන 731.52 කින් හෙවත් සියයට 29.40 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සමස්ථ හිඟ බදු ආදායම වන රු.මිලියන 21,315.80 න් රු.මිලියන 5,707.65 ක් හෙවත් සියයට 26.77 ක් ඛණිජ තෙල් නිෂ්පාදන බදු ආදායම නියෝජනය කරනු ලබයි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින රු.මිලියන 18.72 ක මුදලක් විවිධ ආදායම් ගිණුමට බැර කර එම වටිනාකම 2017 පෙබරවාරි 28 දින ආදායමින් ඉවත් කර තිබුණි. මෙම සටහන්වලට අදාල වූ හේතු විගණනය වෙත ඉදිරිපත් කරන ලද ජර්නල් සටහන් තුලින් අනාවරණය නොවූ අතර ගනුදෙනුවට පදනම් වූ කරුණුද විගණනය වෙත ඉදිරිපත් නොකරන ලදි.

(ඉ) 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු කිරීම, රැස් කිරීම, අධීක්ෂණය හා වාර්තා කිරීම පිළිබඳව මාර්ගෝපදේශයන්ට අදාල චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 128 (2) (ඇ) ප්‍රකාරව හිඟ රාජ්‍ය ආදායම පිළිබඳ තත්වය පෙන්නුම් කෙරෙන අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර එම කාලසීමාවන් අවසන් වීමෙන් පසු එළඹෙන මාසය ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, ශ්‍රී ලංකා රේගුව විසින් අදාල වාර්තා එවා තිබුණේ 2017 මාර්තු 27 දින දීය.

(ඊ) මුදල් රෙගුලාසි 85 (1) (ආ) ප්‍රකාරව ආදායම වැඩිවීමකට හෝ අඩුවීමකට අදාලව සියලුම ප්‍රයෝජනවත් තොරතුරු දැක්වීමට ආදායම් ගණන්දීමේ නිලධාරීයා සුපරීක්ෂාකාරී විය යුතු වුවද, එසේ කර නොතිබුණි.

(උ) මුදල් රෙගුලාසි 85 (1) (ඇ) ප්‍රකාරව හැකිතාක් තාත්වික හා නිවැරදි ලෙස ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වුවද, රේගුව විසින් ඒ අනුව කටයුතු කර ඇතිද යන්න ප්‍රශ්නගත විය.

## 3.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂයය අංක 24701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කල සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීම හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 6.43 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ සඳහා වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා කාල පරාසයක් ගතවී තිබුණි. මුදල් රෙගුලාසි 485 (4) හා 2004 ඔක්තෝබර් 01 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1.1.6 සහ 1.1.7 වගන්තිවල උපදෙස් ප්‍රකාරව නිලධාරියෙක් මාරු වී ගොස් මාස 03 ක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂ නොතිබීමට වගබලා ගත යුතු වුවත්, වර්ෂ 04 කට වඩා කල් ඉක්මවූ ණය ශේෂද තවදුරටත් නිරවුල් නොවී පැවතුණි.එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 1994 අගෝස්තු 18 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 ඡේදය පරිදි ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ දැක්වෙන උපලේඛනයේ ස්ථාන මාරු වී ගිය දිනය, මාරු වී ගිය අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව යනාදී තොරතුරු සඳහන් කළ යුතු වුවත්, එම විස්තර අදාල උපලේඛනයේ සඳහන් කර නොතිබුණි.

(ඇ) විශ්‍රාම ගිය හා මිය ගිය සහ වැඩ තහනම් කරන ලද නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂයන් ආපසු අය කිරීම සම්බන්ධව ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 04, ඡේදය අනුව කටයුතු කර නොතිබීම හේතුවෙන් 2016 වර්ෂය අවසානයේදී පිළිවලින් රු.මිලියන 2.44 ක් හා රු.මිලියන 1.59 ක් වූ චලනය නොවූ ණය ශේෂයන් පැවතුණි.

(ඈ) දිගු කාලයක් තිස්සේ පැවත එන සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.603.580 ක් වූ ණය ශේෂයන් අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හෝ 4.6 ඡේදවලට අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) නිලධාරීන් 07 දෙනෙකුට අදාල 2016 දෙසැම්බර් 31 දිනට වූ ණය ශේෂ රු.416,631 ක් අඩුවෙන් දක්වා තිබුණි.

## 3.9 අත්අඩංගුවට ගන්නා ලද හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අත්තිකාරම් ගිණුමේ අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 28.09 ක් වූ අතර, වර්ෂයකට වැඩි කාලයක සිට එසේ පැවත එන ශේෂයන්ගේ එකතුව රු.මිලියන 21.72 ක් විය. එම හිඟ හිටි අත්තිකාරම් පියවා ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) රේගුව විසින් පවත්වාගෙන ගොස් තිබූ අත්තිකාරම් ගෙවීම් ලෙජරය හා ඉදිරිපත් කල ගිණුම් අනුව රු.77,681 ක නොසැසඳීමක් නිරීක්ෂණය වූ අතර මේ සඳහා හේතු ඇතුලත් සැසඳුම් ප්‍රකාශයක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) වාර්තා හා ලේඛන නිසි පරිදි පවත්වාගෙන නොයාම, අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම වැනි අඩුපාඩු නිසා රේගු විමර්ශනයන් 07 ක් සඳහා ලබාදී තිබූ රු.413,383 ක අත්තිකාරම්වලින් රු.297,196 ක් පියවා නොතිබුණි.

(ඈ) රු.318,051 ක අත්තිකාරම් ලබාදී තිබූ රේගු විමර්ශනවල කටයුතු අවසන්වී ත්‍යාග මුදල් බෙදා දී තිබුණද 2016 වර්ෂයේ අත්තිකාරම් ගිණුම් තුල එම ශේෂයන් තවදුරටත් හිඟ අත්තිකාරම් ශේෂ ලෙස දක්වා තිබුණි.

**3.10 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.10.1 අභ්‍යන්තර විගණනය**

විගණන හා කළමනාකරණ චක්‍රලේඛ අංක DMA/2009 (1) හි විධිවිධානවලට අනුව විගණන කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් හා පුහුණු කාර්ය මණ්ඩලයක් අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කළ යුතු වුවද රාජ්‍ය ආදායමෙන් සියයට 40 කට ආසන්න ඉහළ දායකත්වයක් ලබා දෙන ආයතනයක් වන ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිලධාරී තනතුර හැරුන විට අනෙකුත් තනතුරු සියල්ලම සඳහා අනුයුක්ත කර තිබුණේ ඒකාබද්ධ සේවයට අයත් කළමනාකරණ සහකාර නිලධාරීන් දොළොස් දෙනෙකු විය. එම නිලධාරීන්ද මාස 6 ක් වැනි කෙටිකාලයක් පමණක් මෙම අංශයෙහි රඳවා තබන අතර ඉන් පසු ශ්‍රී ලංකා රේගුවේ වෙනත් අංශයන් වෙත ස්ථානමාරු කිරීම නිසා ගුණාත්මක විගණනයක් කිරීමට ඇති හැකියාව අවම මට්ටමක පැවතුණි. මේ නිසා ආයතනයේ අවශ්‍යතාවයට අනුකූල වන පරිදි පුහුණුව ලත් කාර්ය මණ්ඩලයක් යෙදවීමේ අවශ්‍යතාවයක් පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3.10.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව විගණන දිනය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. කෙසේ වුවද ශ්‍රී ලංකා රේගුව 2017 සැප්තැම්බර් 26 දින යථෝක්ත වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි.

**3.11 වත්කම් කළමනාකරණය**

ශ්‍රී ලංකා රේගුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

නව රේගු ගොඩනැගිල්ලේ රු.මිලියන 21.64 ක් වැය කර ස්ථාපිත කර තිබූ පිවිසුම් පාලන පද්ධතිය වර්තමානයේ අපේක්ෂිත ක්‍රියාකාරී තත්වයෙන් බැහැරව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌණතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) (අ) පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-------------------------------------------

රේගුව විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) ශ්‍රී ලංකා රේගුවට අයත් උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ඇති ඇතැම් ඉඩම් යුධ හමුදා පරිහරණයට ලබා දී තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් පැවරීමට හෝ පවරාගැනීමේ අවසන් අදියරයට හෝ පැමිණ නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා රේගුව විසින් නීත්‍යානුකූල පැවරීමකින් තොරව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මීගමුව මුන්නක්කරය පිහිටි වරිපනම් අංක 08 දරන ඉඩම ලබාදී තිබුණි.

(iii) ශ්‍රී ලංකා රේගුවට අයත් මීගමුව සෙල්බි පාරේ හා මීගමුව ස්ටීවන් වෝක් පටුමගෙහි පිටිහි ඉඩම් නීත්‍යානුකූල පැවරීමකින් තොරව බාහිර පාර්ශවයන් විසින් භාවිතයට ගෙන තිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

----------------------------

2016 දෙසැම්බර් 09 දිනැති අංක 252/2016 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දිනට වූ බැරකම් නිවැරදිව හෙළිදරව් කළ යුතු වුවත්, විසර්ජන ගිණුම සමඟ වූ DGSA 8 (1) ආකෘතිය තුළ එකතුව රු.මිලියන 4.60 ක් වූ බැරකම් අනාවරණය කර නොතිබුණි.

## 3.12 අනුකූල නොවීම්

--------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

-------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) V වැනි පරිච්ඡේදයේ 7.1 වගන්තිය | - | නිවාඩු ලබා නොගෙන රාජකාරියට නොපැමිණෙන නිලධාරියෙකු සම්බන්ධයෙන් එලෙස නොපැමිණි දින සිට සිය තනතුර හැරගියා සේ සලකනු ලබන බව එකී නිලධාරියාට ලියාපදිංචි කල තැපැලෙන් හෝ පෞද්ගලිකව ලිපියක් භාරදීමෙන් හෝ වහාම දන්වා යැවිය යුතු වුවද, එසේ කටයුතු නොකල අවස්ථාවක් විය. එසේම අදාල කාලපරිච්ඡේදය තුලදීම එම නිලධාරියා උසස් තනතුරකටද පත්කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) | XV පරිච්ඡේදයේ 11.1 වගන්තිය | 1,693,600 | දෙපාර්තමේන්තු ප්‍රධානීන් හැර අනෙකුත් සියළුම නිලධාරීන් ගුවන් ගමනකදී අරපිරිමැසුම් පංතියේ ගමන් කල යුතු වුවත්, විදේශගත වූ නිලධාරීන් පස්දෙනෙකු ව්‍යාපාරික පංතියේ ගමන් කර අදාල වියදම් පියවා ගෙන තිබුණි. |
| | (iii) | XXVIII පරිච්ඡේදයේ 1.3 වගන්තිය | - | ඇතැම් නිලධාරීන් පැමිණෙන හා පිටත්ව යන වේලාව ස්වකීය අත්සනද සහිතව පැමිණීමේ ලේඛනයේ සටහන් කර නොතිබුණු අතර පැමිණීමේ ලේඛනය දෛනිකව මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණයට ද ලක්වී නොතිබුණු අවස්ථා විය. |
| | (iv) | XLVIII පරිච්ඡේදයේ 27.7 වගන්තිය | | බන්ධනාගාරගත කල නිලධාරියෙකුට එකී කාලය සඳහා අනිවාර්ය නිවාඩු ලබාදීම සඳහා මාස 04 ක කාලප්‍රමාදයක් සිදු වී තිබුණි. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | (i) | මුදල් රෙගුලාසි 104 (4) | - | 2016 වර්ෂය තුළ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ වාහන 07 කට සිදු වී තිබූ හදිසි අනතුරු සම්බන්ධව අප්‍රමාදව කටයුතු කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 571(1) | | දණ්ඩන හා විකුණුම් ආදායමට අදාලව තැන්පත් කරන ලදුව වර්ෂ දෙක ඉක්මවූ තැන්පත් සඳහා අර්ධ වාර්ෂික ලැයිස්තු පිළියෙල කොට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) | මුදල් රෙගුලාසි 1646 | - | කුලී පදනම මත ලබාගෙන තිබූ වාහන දෙකක 2016 මැයි 01 සිට 2017 අප්‍රේල් 30 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල දෛනික ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (1) ඡේදය | | - | රාජ්‍ය සේවයේ සියළුම නිලධාරීන් ඇඟිලි සළකුණු යන්ත්‍රය මගින් තම පැමිණීම හා පිටවීම සළකුණු කළ යුතුය. එම චක්‍රලේඛය පදනම් කොට නිකුත් කරන ලද 2010 පෙබරවාරි 19 දිනැති අංක 01/2010 දරන රේගු දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ v ඡේදය පරිදි 2010 මාර්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි රේගු දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් ඇඟිලි සළකුණු යන්ත්‍ර මගින් පැමිණීම හා පිටවීම සළකුණු කල යුතු වුවත්, ශ්‍රී ලංකා රේගුවේ හා එහි උප කාර්යාලවල ඇඟිලි සළකුණු යන්ත්‍ර මෙම වාර්තාවේ දින තෙක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ඈ) | 2016 දෙසැම්බර් 9 දිනැති අංක 252/2016 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 9 වගන්තිය | | - | විසර්ජන ගිණුමට අමතරව චක්‍රලේඛය සමග දක්වා ඇති ආකෘති වලට අනුකූලව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියල කර 2017 ජුනි 30 දිනට පෙර රාජ්‍ය |

| | | | |
|---|---|---|---|
| | | | ගිණුම් දෙපාර්තමේන්තුවට ද පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්,එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිසම් සහා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 87 ඡේදය | - | නියමිත පරිදි විවාහක නිලධාරීන් සම්බන්ධව සහතික කරන ලද විවාහ සහතිකයේ පිටපතක්, දරුවන්ගේ උප්පැන්න සහතිකවල පිටපත්, නිලධාරියාගේ විවාහය පිළිබඳව හා දරු උපත් පිළිබඳව දැනුම් දීම (වැන්දඹු/ පුරුෂ අනත් දරු විශ්‍රාම වැටුප් සඳහා) යනාදිය පෞද්ගලික ලිපිගොනුවෙහි ඇතුළත් කළ යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය | - | (i) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගෙන්ද විමසා මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලබන ගෙවීම් ප්‍රමාණවලට අනුකූලව රේගු දෙපාර්තමේන්තුවේ අතිකාල ගෙවීම් සිදු කර නොතිබුණි. |
| | | | (ii) 2013 වර්ෂයේදී එතෙක් ගෙවමින් පැවති අතිකාල දීමනා අනුපාතයන් දෙපාර්තමේන්තුවේ අතිකාල කමිටුව විසින් තවදුරටත් සියයට 45 කින් වැඩිකර තිබුණද, ඒ සඳහා නිශ්චිත අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |
| | | | (iii) ශ්‍රී ලංකා රේගුව විසින් වර්තමානයේ අතිකාල ගෙවීම් කිරීමේදී පැය 24 ක නිවාඩු දිනයක් සඳහා පැය 27 ක අතිකාල ගෙවීමක්ද සාමාන්‍ය වැඩ කරන දිනයක් සඳහා පැය 18 ¾ දක්වා වූ අතිකාල ගෙවීමක්ද සිදු කර තිබුණද, ඒ සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |
| (උ) | 2010 පෙබරවාරි 19 දිනැති අංක 01/2010 දරන දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛය 3(IV) ඡේදය | - | (i) නිලධාරියෙකු පැමිණීම සටහන් කර ඇති නමුත් පිටවීම සටහන් කර නොමැති නම් ඒ සෑම දිනයක් වෙනුවෙන් දින භාගයක් නිලධාරියාගේ නිවාඩු වලින් අඩුකළ යුතු වුවද, කටුනායක ගුවන් තොටුපල මගී පැමිණීමේ පර්යන්තයේ පිහිටි රේගු උප කාර්යාලයේ එසේ කර නොතිබුණි. |
| | | - | (ii) නිලධාරියකු යම් රාජකාරි කාර්යක් සඳහා රාජකාරි ස්ථානයෙන් බැහැරව යන්නේ නම් ඒ පිළිබඳ බැහැර යාමේ ලේඛනයේ සටහන් කර මාණ්ඩලික නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, කටුනායක ගුවන් තොටුපල මගී පැමිණීමේ පර්යන්තයේ පිහිටි රේගු උප කාර්යාලයේ එසේ බැහැරව යාමේ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

**3.13 කාර්යසාධනය**

------------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ශ්‍රී ලංකා රේගුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ආදායම් එකතු කිරීම**

-----------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත බදු ආදායම හා තථ්‍ය බදු ආදායම ඉකුත් වර්ෂයේ බදු ආදායම් සමඟ සසඳා පහත දැක්වේ.

| | 2016 | | | 2015 | | |
|---|---|---|---|---|---|---|
| | සංශෝධිත ඇස්තමේන්තු අනුව බදු ආදායම | තථ්‍ය බදු ආදායම | තථ්‍ය බදු ආදායම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස | සංශෝධිත ඇස්තමේන්තු අනුව බදු ආදායම | තථ්‍ය බදු ආදායම | තථ්‍ය බදු ආදායම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
| විදේශ වෙළඳාම මත බදු | රු. මිලියන | රු. මිලියන | | රු. මිලියන | රු.මිලියන | |
| ආනයන බදු | 160,000 | 156,487 | 97.80 | 92,000 | 108,116 | 117.51 |
| අපනයන බදු | 300 | 31 | 10.33 | 60 | 33 | 55 |
| වරාය හා ගුවන්තොටුපල බදු | 90,000 | 88,823 | 98.69 | 55,000 | 56,733 | 103.15 |
| සෙස් බදු (ආනයන) | 55,000 | 59,058 | 107.38 | - | - | - |
| මෝටර් රථ අනුග්‍රහක බදු | - | - | - | 42,000 | 42,467 | 101.11 |
| ප්‍රාදේශීය යටිතල පහසුකම් බදු | - | 0.87 | - | - | 0.29 | - |
| සෙස් බදු - (අපනයන) | 2,000 | 2,672 | 133.60 | 3,400 | 2,713 | 79.79 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 58,000 | 55,825 | 96.25 | 56,000 | 52,275 | 93.34 |
| <u>නිෂ්පාදන බදු</u> | | | | | | |
| සිගරට් | | 88,752 | 98.61 | 80,000 | 79,981 | 99.97 |
| | 90,000 | | | | | |
| මත්පැන් | 50 | - | - | - | - | - |
| ඛණිජතෙල් | 50,000 | 55,719 | 111.44 | 34,000 | 45,091 | 132.62 |
| මෝටර්රථ | 190,000 | 186,499 | 98.16 | 240,000 | 223,414 | 93.09 |
| අනෙකුත් | 4,000 | 3,704 | 92.60 | 10,000 | 3,812 | 38.12 |
| ඇඟලුම් සඳහා දේශීය විකුණුම් සඳහා ගාස්තු | 130 | 167 | 128.46 | 100 | 121 | 121 |
| දඩ හා රාජසන්තක කිරීම් | 1,500 | 2,134 | 142.27 | 1,400 | 1,129 | 80.64 |
| මුළු එකතුව | 700,980 | 699,872 | 99.84 | 613,960 | 615,888 | 100.31 |

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව ආදායම් සංකේත 16 ක් යටතේ රු. මිලියන 699,872 ක ආදායමක් රැස් කර තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී එම ආදායම් සංකේත 16 යටතේ රැස්

කල ආදායම රු.මිලියන 615,888 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.මිලියන 83,984 ක් හෙවත් සියයට 14 කින් වැඩි වී තිබුණි. මෝටර් රථ නිෂ්පාදන බදු, ආනයන බදු, වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු, සිගරට් නිෂ්පාදන බදු , ආනයන සෙස් බදු , විශේෂ වෙළඳ භාණ්ඩ බදු යනාදියෙහි වැඩිවීම මෙම ආදායම් වැඩිවීම සඳහා මූලිකවම බලපා තිබුණි.

(ආ) රු.මිලියන 50,000 ට වැඩි ඇස්තමේන්තුගත ආදායම් සහිත සංකේතයන් 06 ක් අතුරින් අපේක්ෂිත ඉලක්ක ඉක්මවා යාමට සමත්ව ඇත්තේ ආනයන සෙස් බදු ආදායම් සංකේතය පමණක් වන අතර, එහි කාර්යසාධනය සියයට 107.38 විය. අනෙකුත් බදු අදායම් සංකේතය 05 අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වී නොතිබුණි.

(ඇ) අපනයන බදු ආදායම් සංකේතයට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 50 ක් වූ මූලික ආදායම් ඇස්තමේන්තුව පසුව රු.මිලියන 300 දක්වා වැඩිකර තිබුණි. එසේ වැඩි කිරීමට අදාල කරගත් දත්ත කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය. සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම රු.මිලියන 31 ක් වූයෙන් රු.මිලියන 269 ක ආදායම් ඌණතාවයක් නිරීක්ෂණය වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 89.58 ක් විය.

(ඈ) ශ්‍රී ලංකා රේගුව විසින් වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සඳහා 2016 වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 71,000 ක් වූ අතර පසුව එය රු.මිලියන 95,000 ක් ලෙස රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කර තිබුණි. නමුත් තථ්‍ය ආදායම රු.මිලියන 88,823 ක් වී තිබුණි. මෙය මුල් ඇස්තමේන්තුව මෙන් සියයට 25 ක් වැනි ඉහළ විචලනයකි. මේ අනුව ශ්‍රී ලංකා රේගුව ආදායම් ඇස්තමේන්තුකරණය පිළිබඳ වඩා වැඩි අවධානයකින් කටයුතු කළ යුතුව පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ රැස් කරන ලද ආනයනික සෙස් බදු ආදායම රු.මිලියන 59,058 ක් වුවද, ශ්‍රී ලංකා රේගුව විසින් 2015 අගෝස්තු 14 දින භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු වෙත යවනු ලැබූ මූලික ඇස්තමේන්තුවේ අගය ලෙස සඳහන් වූයේ රු.මිලියන 40,000 ක් පමණි. ඒ අනුව තථ්‍ය බදු ආදායම මෙම මූලික ඇස්තමේන්තුවට වඩා සියයට 48 කින් ඉහළ යාමක් සිදුව ඇති බව නිරීක්ෂණය විය.

(ඊ) ඉකුත් වර්ෂ 04 ක කාලය තුල අපනයන සෙස් බදු ආදායම රු.මිලියන 3,000 කට ආසන්නව තිබියදී 2016 වර්ෂයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අනුව එය රු.මිලියන 2,000 ක් ලෙස ගණනය කිරීමට බලපෑ හේතු විගණනයට ඉදිරිපත් නොවීය. ඇස්තමේන්තුගත ආදායම අසාමාන්‍ය ලෙස අඩුකිරීම හේතුවෙන් මෙම ආදායම් සංකේතය යටතේ තථ්‍ය කාර්යසාධනය සියයට 134 ක් ලෙස ඉහළ අගයක් ගෙන තිබුණි.ඉකුත් වර්ෂයේ එය සියයට 79.79 ක අගයක් ගෙන තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව ආදායම් සංකේතාංක 10.02.05.04 යටතේ මෝටර් වාහන නිෂ්පාදන බදු ලෙස රු.මිලියන 186,499.20 ක ආදායමක් රැස්කර තිබූ අතර ඉකුත් වර්ෂයේදී රැස් කළ ආදායම රු.මිලියන 223,413.69 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.මිලියන 36,914.48 කින් හෙවත් සියයට 16.52 කින් අඩුවී තිබූ බව නිරීක්ෂණය විය. රජයේ ඉහළ බදු ප්‍රතිපත්තිය නිසා වාහන ආනයනය සීමා වීම මෙසේ බදු ආදායම අඩුවීම සඳහා මූලික වශයෙන් බලපා තිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව විසින් ඇගළුම් සඳහා දේශීය විකුණුම් මත ගාස්තු ආදායම් සංකේතය යටතේ රු.මිලියන 167.14 ක ආදායමක් එකතු කර තිබූ අතර ඉකුත් වර්ෂයේදී එකතු කළ ආදායම රු.මිලියන 121.64 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආදායම රු.මිලියන 45.50 කින් හෙවත් සියයට 37.41 කින් වැඩි වී තිබුණි.

(එ) විශේෂ වෙළඳභාණ්ඩ බදු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 65,000 ක් වූ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 58,000 ක් දක්වා සංශෝධනය කර තිබුණි. කෙසේ වුවද විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධව 2015 අගෝස්තු 14 දින රාජ්‍ය මූල්‍ය හා ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද නව ඇස්තමේන්තුව රු.මිලියන 72,000 ක් විය. ඒ අනුව රැස්කල තථ්‍ය ආදායම රු.මිලියන 55,825 ක් වූ අතර එය ඇස්තමේන්තුවෙන් සියයට 77.53 විය.

(ඒ) සිගරට් නිෂ්පාදන බදු ආදායම් සංකේතය යටතේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා ශුද්ධ ආදායම් රැස්කිරීම් අතර වෙනසට හේතුව ලෙස සිගරට් බදු වැඩිවීම නිසා පරිභෝජනය අඩුවීම ලෙස දක්වා තිබුණි. නමුත් පසුගිය වසරට සාපේක්ෂව සිගරට් නිෂ්පාදනය ඒකක මිලියන 165 කින් පමණක් අඩුවී තිබුණද, ආදායම් රැස් කිරීම රු.මිලියන 8,771 කින් හෙවත් සියයට 10.97 කින් වැඩිවී තිබුණි. සිගරට් සඳහා නිෂ්පාදන බදු ඉතා ඉහළ අනුපාතයකින් ඉහළ දැමීම මෙම බදු ආදායම වැඩිවීම සඳහා මූලිකවම බලපා තිබුණි.

(ඔ) අනෙකුත් නිෂ්පාදන බදු සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී රැස්කර තිබූ ආදායම රු.මිලියන 3,812 ක් ව තිබියදී සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 11,200 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 4,000 ක් දක්වා පසුව සංශෝධනය කර තිබුණි. මෙම සංකේතය යටතේ රැස් කර ගෙන තිබුණු ආදායම රු.මිලියන 3,703 ක් විය. රැස් කළ බදු ආදායම මූලික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 33.06 ක් වූ අතර සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 92.57 කි.

(ඕ) ශ්‍රී ලංකා රේගුව විසින් ඇගළුම් සඳහා දේශීය විකුණුම් මත ගාස්තු නැමැති ආදායම් සංකේතය සඳහා ඉදිරිපත් කරන ලද මූලික ඇස්තමේන්තුව රු.මිලියන 120 ක් වූ අතර එහි තථ්‍ය ආදායම රු.මිලියන 167 ක් විය. ඒ අනුව තථ්‍ය ආදායම් රැස්කිරීම මූලික ඇස්තමේන්තුවෙන් සියයට 139 ක් විය. එමෙන්ම අදාල ඇස්තමේන්තුවේ ඉඩදිය හැකි පාලන අපගමන සීමාව සඳහන්ව නොතිබුණි.

(ක) ශ්‍රී ලංකා රේගුවේ නීති බලාත්මක කරන ප්‍රධාන අංශයක් වන්නේ නිවාරණ අංශය වන අතර රේගු වැරදි හසුකර ගැනීම, සැක කටයුතු භාණ්ඩ අල්ලා ගැනීම, රේගු විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීම සහ නඩු කටයුතු මෙහෙයවීම එහි ප්‍රධාන කාර්යයන්වේ. 2016 වර්ෂය තුලදී රේගු නිවාරණ අංශය මගින් මෙහෙයවනු ලැබූ ලියාපදිංචි වී තිබූ රේගු විමර්ශන සංඛ්‍යාව 808 ක් වී තිබුණද, වැරදි තහවුරු කර අභිමි කිරීම් හෝ දඩ නියම කල විමර්ශන සංඛ්‍යාව 383 ක් පමණක් වී තිබූ අතර දඩ හා අභිමි කිරීම් මගින් අයකර ගෙන තිබූ ආදායම රු.මිලියන 577 ක් විය. එහෙත් පරීක්ෂණ 425 කට අදාලව කටයුතු නිම කර වැරදි තහවුරු කර අභිමි කිරීමක් හෝ දඩ නියම කිරීමක් 2016 වර්ෂයේදී සිදු කර නොතිබුණි. ඒ අනුව ඒ මගින් අයකරගත හැකිව තිබූ ආදායම් ද මගහැරී තිබුණි.

(ග) අපනයන සැකසුම් කළාපවල කටයුතු හා වරාය කටයුතු අධීක්ෂණය කිරීම, රේගු නීති බලාත්මක කිරීමේ පර්ෂදය යටතේ පවතිව නිවරණ අංශයේ වගකීමක් වුවද, පල්ලේකැලේ, හොරණ හා මීරිගම පිහිටි අපනයන සැකසුම් කළාප සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 31 දින වන විටත් රේගු නිවාරණ අංශය මගින් සිදු කල යුතු සුපරීක්ෂණ කටයුතු සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම එම කළාප ආශ්‍රිතව උපනිවාරණ කාර්යාල පිහිටු වීමට හෝ වෙනත් උප නිවාරණ කාර්යාල වලින් නිලධාරීන් පත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. තවද දික්ඕවිට පිහිටුවා ඇති මත්ස්‍ය වරායෙහි රේගු නිවාරණ අංශයේ ක්‍රියාකාරකම්ද 2017 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ජ) ශ්‍රී ලංකාව මත්ද්‍රව්‍ය බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් බවට පත් වෙමින් පවතින බව නිරීක්ෂණය වන හෙයින් මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු සඳහා UNODCWCO හා WCO මාර්ගෝපදේශ මත පරිගණක පාලන වැඩසටහන් ස්ථාපිත කල යුතු බවට හඳුනාගෙන තිබූ නමුත් එහි ප්‍රධාන ක්‍රියාකාරකම් 04 ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර 2017 දෙසැම්බර් 31 දින වන විටත් ශ්‍රී ලංකා රේගුව විසින් ගෙන නොතිබුණි. ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) බහාළුම් ගමන් මාර්ග ලුහුබැඳීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

(ii) වාණිජ බහාළුම්වල සඟවා රැගෙන එන මත්ද්‍රව්‍ය සොයා ගැනීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම.

(iii) සැක කටයුතු මුහුදු ගමන් මාර්ග හා ආනයනකරුවන් ඉලක්ක කිරීම.

(iv) සැක කටයුතු බහාළුම් පරීක්ෂා කිරීම සඳහා රඳවා ගැනීම.

(ට) ශ්‍රී ලංකා රේගුවේ ආදායම් ඉපැයීමේ කාර්යසාධනය තක්සේරු කිරීමේදී පහත සඳහන් ක්‍රියාකාරකම්වල බලපෑම නිසා සිදු වන ආදායම් වර්ධනය මැන බැලිය හැකි ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

(i) බදු අනුපාත ඉහළ දැමීම නිසා සිදුවන බදු ආදායමේ වර්ධනය

(ii) භාණ්ඩ හා සේවාවල විදේශ වෙළඳපොල මිළ ගණන් ඉහළ යාම නිසා සිදු වන ආදායම් වර්ධනය

(iii) විනිමය අනුපාතයන්ගේ විචලනයන් නිසා සිදු වන බදු ආදායමේ වර්ධනය

(iv) විවිධ හේතු නිසා සිදු කරන ආනයනයන්ගේ වැඩිවීම නිසා සිදු වන ආදායම් වර්ධනය.

**3.14 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළයුතු ශේෂ**

බැංකු ජංගම ගිණුමකට අදාලව ශ්‍රී ලංකා රේගුව විසින් 2016 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|
| | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි 03 ට අඩු | වර්ෂ 03 ට වැඩි | |
| | රු. | රු. | රු. | |
| (i) තැන්පත් කල නමුත් නිශ්කාෂණය නොවූ චෙක්පත් | 106,533 | 8,784 | 4,166,667 | 4,281,984 |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 428,425 | - | - | 428,425 |
| (iii) | හඳුනා නොගත් හර | 741,735 | - | - | 741,735 |
| (iv) | හඳුනා නොගත් බැර | 2,558,313 | - | - | 2,558,313 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයේ තැන්පත් කළ නමුත් නිශ්කාෂණය නොවූ චෙක්පත් ලෙස වාර්තාකර ඇති රු.4,166,667 ක මුදල 2011 අගෝස්තු සිට ඉදිරියට ගෙන එමින් පැවති ශේෂයක් විය. මෙම වටිනාකම 2017 මාර්තු මාසයේදී නිවැරදි කල බවට ශ්‍රී ලංකා රේගුව ප්‍රකාශ කළද, 2017 මැයි මස බැංකු සැසඳුම තුළද මෙම වටිනාකම තවදුරටත් උපලබ්ධි නොවූ චෙක්පත් ලෙස පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට හඳුනානොගත් ලැබීම් ලෙස වාර්තාකර ඇති රු.2,558,313 ක මුදල විධිමත් පරිදි හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට රු.741,735 ක් වූ හඳුනානොත් ගෙවීම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.15 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

ශ්‍රී ලංකා රේගුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) තීරුබදු රහිත මත්පැන් වෙළඳසැල්වල අලෙවිය මත උපයන සියලුම විදේශ විනිමය නිවැරදිව එම වෙළඳසැල් නමින් පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර බැංකු ගිණුමක තැන්පත් කල යුතු වුවද, කොළඹ වරාය පරිශ්‍රයේ පිහිටි තීරුබදු රහිත මත්පැන් වෙළඳසැලක් විසින් 2014 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා ඇ.ඩො. 5,193 ක්ද, 2015 වර්ෂය සඳහා ඇ.ඩො. 12,568 ක්ද සහ 2016 ජූනි 30 දින දක්වා ඇ.ඩො. 8,631 ක්ද ලෙස එකතුව ඇ.ඩො. 26,393 (රු. 3,902,876) ක ආදායමක් බැංකුවේ තැන්පත් කර නොතිබුණි. එම තීරුබදු රහිත වෙළඳසැල අධීක්ෂණය කාර්යයෙහි නිරත වූ රේගු නිලධාරියාට කොමිස් මුදලක් ලබා දෙන බව එම සමාගමේ ගණකාධිකාරී, තීරුබදු රහිත වෙළඳසැලෙහි කළමනාකරු සහ මුදල් අයකැමි ලිඛිතව ප්‍රකාශකර තිබුණි. එසේම අදාල වෙළඳසැල රැස්කරන ආදායම නිවැරදිව ගණනය කර බැංකුවේ තැන්පත් කර ඇත්ද යන්න රේගුවේ කර්මාන්ත හා සේවා අංශය (බැඳුම්කර අංශය) විසින් හෝ රේගුවේ වෙනත් අංශයකින් (උදා:-PCAD) හෝ අධීක්ෂණය කර නොතිබුණු අතර එක් රේගු නිලධාරියෙකු පමණක් වෙළඳසැලෙහි සේවයේ යොදවා තිබුණි.

(ආ) රේගු විමර්ශනයකදී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා මූලික විමර්ශන නිලධාරියාට රේගු ආඥා පනතේ 8 වන වගන්තිය මගින් නීතිමය ප්‍රතිපාදන සැලසී තිබුණි. මෙම නීතිමය ප්‍රතිපාදන මත අංක PREV/FPO/1725/2015 දරන රේගු විමර්ශන කටයුතු සඳහා රේගු විමර්ශන නිලධාරියා විසින් රු.මිලියන 10 ක දණ්ඩනයක් පනවා තිබූ නමුත් පසුව ලද අභියාචනයක් මත අදාල විමර්ශන නිලධාරී විසින් එම දණ්ඩන මුදල රු.මිලියන 3 දක්වා අඩු කර තිබුණි. එහෙත් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට එවැනි නෛතික ප්‍රතිපාදන නොමැති බව නීතිපතිවරයා විසින්ද ලිඛිතව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දන්වා තිබුණි.

(ඇ) 2016 ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා වූ කාලපරිච්ඡේදය තුල කටුනායක ගුවන් තොටුපල රේගු කාර්යාලය විසින් රැස්කල මුළු ආදායම රු.මිලියන 314.41 ක් වූ අතර එම ආදායමින් රු.මිලියන 6.69 ක් රේගු නිලධාරීන්ගේ අතිකාල අරමුදලටද දණ්ඩන ආදායමින් රු.මිලියන 76.13 ක් රේගු නිලධාරීන්ගේ ත්‍යාග ගෙවීම් අරමුදල හා කළමනාකරණ වන්දි

අරමුදලටද බැර වන හෙයින් රාජ්‍ය ආදායමට සිදුවී තිබූ දායකත්වය රු.මිලියන 231.59 ක් හෙවත් රැස්කළ මුළු ආදායමින් සියයට 74 කට ආසන්න අගයක් වී තිබුණි.

(ඇ) රජය විසින් සිගරට් මත අයකරනු ලබන බදු අනුපාත ඉහළ නංවන අවස්ථාවලදී ලංකා දුම්කොල සමාගමේ තොග නියෝජිතයන් ලෙස නිෂ්පාදන බදු අංශයේ ලියාපදිංචි වී ඇති ආයතන තුල පවතින සිගරට් තොග වෙනුවෙන් බදු අය නොකිරීම හේතුවෙන් රාජ්‍ය ආදායම අතිවිශාල වශයෙන් අහිමි වීමක් සිදු වී තිබුණද, 1990 වර්ෂයේ සිට සිගරට් බදු අනුපාත වෙනස් කල අවස්ථා 37 ක් තුල එක් අවස්ථාවකදී හෝ අදාල තොග මත ගැළපූ බද්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කොළඹ මධ්‍යම තැපැල් හුවමාරු කාර්යාලයට මුහුදු හා ගුවන් මගින් ලැබෙන තැපැල් මළු විවෘත කිරීම, වර්ග කිරීම සහ ගබඩා කිරීම යනාදිය රේගු නිලධාරීන්ගේ සහභාගීත්වයක් නොමැතිව තැපැල් දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදු කරනු ලබන හෙයින් රේගු බදු අයවිය යුතු හෝ ආනයනය තහනම් කර ඇති හෝ සීමා කරන ලද හෝ භාණ්ඩ ඇතුලත් තැපැල් පාර්සල් බදු අයකිරීමකින් හෝ රාජසන්තක කිරීමකින් හෝ තොරව ඉවත් කර ගැනීමේ හැකියාවක් පැවති බව නිරීක්ෂණය විය.

(ඊ) මධ්‍යම තැපැල් හුවමාරු කාර්යාලයට අනුයුක්තව ඇති රේගු නිලධාරීන් විසින් කුඩා පාර්සල් සම්බන්ධයෙන් නියැදි පරීක්ෂාවක් පමණක් සිදු කරන බැවින් වැඩි වටිනාකමක් සහිත කුඩා භාණ්ඩ රේගු බදු අයවීමකින් තොරව නිදහස් වීමට ඉඩකඩ තිබුණු අතර සංගණනය ආවරණය වන පරිදි ක්‍රමවත් නියැදි ක්‍රමයක් භාවිතා කර අදාල නියැදිය තෝරාගෙන පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි. මේ සඳහා නවීන තාක්ෂණය සුදුසු පරිදි අදේශනයක්ද සිදු වී නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 03 වගන්තිය ප්‍රකාරව ස්වකීය පත්කිරීමේ කොන්දේසි අනුව සේවයෙහි ස්ථිර කරනු ලැබීම පිණිස ලබාගත යුතු කිසියම් සුදුසුකමක් ලබාගැනීම සඳහා මිස පරිවාසය පිට සිටින නිලධාරියෙකු අධ්‍යයනය හෝ අභ්‍යාසය සඳහා පිටරට නොයැවිය යුතු නමුත් ඊට පටහැනිව පරිවාස කාලය තුල සිටින සහකාර රේගු අධිකාරී නිලධාරියකු ඕස්ට්‍රේලියාවේ පැවැති සති 13 ක ඉංග්‍රීසි පාඨමාලාවකට සහභාගී කරවා තිබුණි.

(ඌ) ඉකුත් වර්ෂයන්හි රාජ්‍ය ආයතනවලට භාණ්ඩ ආනයනය කිරීමේදී අනාවරණය වී තිබූ විවිධ රේගු වැරදි සම්බන්ධයෙන් රේගු විමර්ශනයන් පවත්වා විශාල වශයෙන් දණ්ඩනයන් පනවා තිබීමත්, එම දණ්ඩන මුදල්වලින් සියයට 70 ක් රේගු නිලධාරීන්ට ත්‍යාග ලෙස ගෙවීම සහ ඔවුන්ගේ සුභසාධන අරමුදලකට බැර කිරීම සම්බන්ධයෙන් විගණන විමසුම් ගණනාවකින් පෙන්වාදී තිබුණි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදු කර තිබූ ගනුදෙනුවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව විසින් සිදු කර තිබුණු රේගු විමර්ශනයකට අදාලව විගණයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එහි මෙහෙයුම් කටයුතු සඳහා 2011 වර්ෂයේදී ආනයනය කර තිබූ රු.මිලියන 11,498.83 ක් වටිනා දොඹකර යන්ත්‍ර 36 කට රේගු සටහන්කර ඉදිරිපත් කර නොතිබුණි. රු.මිලියන 916.53 ක බදු මුදල්ද ගෙවා නොතිබුණි. මේ යන්ත්‍ර ආනයනය කළ අවස්ථාවේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය දක්වා අදාල බදු මුදල් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) මෙම දොඹකර යන්ත්‍ර 36 ට අදාලව රේගු සටහන්කර ඉදිරිපත් නොකිරීම හා බදු නොගෙවීම සම්බන්ධයෙන් 2013 වර්ෂයේ සිට සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකටම ප්‍රගති වාර්තාවක් මගින් දැනුම් දීමට අධිකාරියේ ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ) විසින් කටයුතු කර තිබුණි. එසේ වුවද, එම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරන රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ පිළිබඳව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) මෙම රේගු වරද සඳහා 2016 වර්ෂයේදී සිදු කරන ලද රේගු විමර්ශනයකින් පසුව 2017 ජුනි 02 දින ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් රු.මිලියන 1,580.10 ක රාජසන්තක කිරීමක් හා දණ්ඩන මුදලක් අයකර ගැනීමට නියම කර තිබුණි. රේගු ආඥා පනතේ පවත්නා නෛතික විධිවිධාන අනුව එසේ අයකර ගැනිමට නියමිත මුදලින් සියයට 70 ක් එනම් රු.මිලියන 1,106.07 ක් රේගු නිලධාරීන්ට ත්‍යාග ගෙවීමට හා රේගු නිලධාරීන්ගේ සුභසාධනය සඳහා පිහිටුවා ඇති රේගු කළමනාකරණ හා වන්දි ඇමුදලට බැර කිරීමට ඉඩකඩ පවතින බව නිරීක්ෂණය විය.

(iv) ඉකුත් වර්ෂවලදීද ලංකා විදුලි බල මණ්ඩලය හා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වැනි ආයතන සම්බන්ධයෙන් එවැනි රේගු විමර්ශනයක් පවත්වා රු.මිලයන 266.02 ක දණ්ඩන මුදල් අයකර ගැනීමටත් එම දණ්ඩන මුදලින් සියයට 70 ක් ලෙස එනම් රු.මිලියන 186.21 ක් රේගු නිලධාරීන්ට ත්‍යාග ගෙවීමට හා ඔවුන්ගේ සුභසාධනය සඳහා පිහිටුවා ඇති කළමනාකරණ හා වන්දි අරමුදලට බැර කිරීමට කටයුතු කර තිබුණි.

(v) දීර්ඝ කාලයක සිට පාඩු ලබමින් ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතන පවත්වාගෙන යාම සඳහා වාර්ෂිකව විශාල මුදලක් ඒකාබද්ධ අරමුදලින් වැය කරන තත්ත්වයක් තුල එම ආයතනවලට තවදුරටත් දණ්ඩන පනවා මුදල් අයකර ගැනීම හේතුවෙන් එම ආයතන මූල්‍ය අර්බුදවලට ලක් වීමට ඉඩකඩ පැවත තිබුණි.

(vi) යථෝක්ත ආයතනවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් සිදු කරන වරදවල් හෝ අතපසුවීම් හේතුවෙන් සිදු වන බදු අලාභයන් සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් වෙනුවෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබෙන බවක් නිරීක්ෂණය විය.

(vii) නිලධාරීන් විසින් සිදු කරන වරදවල් සඳහා විධිමත් ක්‍රියාමාර්ග නොගතහොත් ඉදිරියේදී ඔවුන් සංවිධානාත්මකව කටයුතු කළ හැකි වීමේ අවදානමක් පැවත තිබුණි.

## 3.16 අවිධිමත් ගනුදෙනු

ශ්‍රී ලංකා රේගුව විසින් එළැඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවන් පහත දැක්වේ.

(අ) කොළඹ වරාය පරිශ්‍රයේ පිහිටි තීරුබදු රහිත මත්පැන් වෙළඳසැලක භෞතික තොග පිළිබඳව විගණන පරීක්ෂාවේදී විදේශීය මත්පැන් වර්ග 12 කට අයත් වටිනාකම රු.149,796 ක් වූ මත්පැන් බෝතල් 60 ක ඌණතාවයක් අනාවරණය වූ අතර එම වටිනාකම මත අහිමි වී ඇති බදු ආදායම රු.276,578 කට ආසන්න ප්‍රමාණයක් විය. රේගු නිලධාරීන් විසින් පසුව මුදල් ගෙවීමේ පොරොන්දුව මත මත්පැන් රැගෙන යාම මෙම ඌනතාවයට හේතු වී තිබුණු බව ලිඛිතව වාර්තා කර තිබුණි.

(ආ) ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ආයතනයන් වෙත වසර 05 ක් දක්වා පූර්ණ ආදායම් බදු නිදහසක්ද, ඊට පසු වසර දෙකක් සඳහා සියයට 10 ක බදු නිදහසක්ද සහ ඉන්පසු වර්ෂයන් සඳහා සියයට 15 බැගින් වන සහනදායී බදු රේටයන් යටතේද ආදායම් බදු ගෙවීමට හැකිවන පරිදි බදු සහන සලසා තිබුණි. එසේ බදු සහන ලබා දෙන ආයතන වල මුළු නිෂ්පාදනයෙන් සියයට 80 ක ප්‍රමාණයක් අපනයනය කල යුතු බව එම ආයතන සමඟ එළඹ තිබුණු ගිවිසුම්වල අන්තර්ගත වුවද, ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයන් ශ්‍රී ලංකා රේගුව තුල ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) ග්‍රේ ලයින් II නැමැති බහාළුම් නිශ්කාෂණ මධ්‍යස්ථානයේ බහාළුම් නිශ්කාෂණය කිරීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකරන බවක් නිරීක්ෂණය විය. එම නිසා රාජ්‍ය ආදායම විශාල වශයෙන් අහිමි වීමට ඉඩකඩ ඇතැයි යන සැකය විගණනයේදී බැහැර කල නොහැකි විය. නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ එවැනි අඩුපාඩු කිහිපයක් පහත දැක්වේ.

(i) පරීක්ෂණ මණ්ඩලය පත් කිරීම, පරීක්ෂණ ක්‍රමය තීරණය කිරීම හා බහාළුම් නිශ්කාෂණය එකම නිලධාරියකු විසින් සිදු කිරීම.
(ii) පරීක්ෂණ මණ්ඩලයේ අවම සංයුතියවත් පවත්වාගෙන නොයාම.
(iii) බහාළුම් අසාමාන්‍ය ලෙස කෙටි කාලයක් තුළදී නිශ්කාෂණය වීම.
(iv) බහාළුම් නිශ්කාෂණ කටයුතු අසාමාන්‍ය ලෙස ප්‍රමාද වීම.
(v) නිශ්කාෂණය සඳහා වැඩිවන බහාළුම් වලට සමගාමීව එම බහාළුම් පරීක්ෂා කරන ක්‍රමවේදය, තාක්ෂණය හා නවීන ක්‍රමවේදයන් සමඟ නවීකරණය නොවීම.
(vi) ආරක්ෂිත කැමරා මගින් නිසි අධීක්ෂණයක් සිදු නොවීම.
(vii) කාර්යාල ප්‍රදේශය ආරක්ෂිත කැමරා මගින් ආවරණය නොවීම.
(viii) පරිගණක පද්ධතිය මගින් තීරණය කරන පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය නිෂ්කාශණ මධ්‍යස්ථානයේදී වෙනස් වීම.

**3.17 පාඩු හා හානි**
**---------------**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) රු.මිලියන 32.20 ක රේගු බදු ආදායම් අක්‍රමිකතාවයක් සිදු කර තිබුණු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි ආයතනක් සඳහා දණ්ඩන මුදලක් පැනවීමේදී අහිමි වූ බදු මුදලේ ප්‍රමාණය කෙරෙහි අවධානය යොමු නොකර රු.මිලියන 17 ක දණ්ඩනයක් පමණක් පනවා තිබීම නිසා රු.මිලියන 15.20 ක බදු ආදායමක් ශ්‍රී ලංකා රේගුවට අහිමි වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි ආයතනයක් විසින් අදාල රේගු බදු ගෙවීමෙන් තොරව මාළු තොග දේශීය වෙළඳපොලට නිකුත් කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා රජයට අහිමි වී තිබූ බදු ආදායම රු.මිලියන 27.10 ක් විය.

(ඇ) කටුනායක ගුවන් තොටුපලේ මගී ගුවන් පර්යන්තය භාවිතා කරමින් සාරි, සල්වාරි, ඇඳුම්, කාන්තා පාවහන්, පරිගණක උපාංග, වාහන අමතර කොටස් යනාදිය වාණිජ පරමාර්ථයෙන් රැගෙන ඒමේදී එම භාණ්ඩ වල වටිනාකම තක්සේරු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් රජයට ලැබිය යුතු බදු ආදායම අහිමි වීමක් සිදු වන බව විගණන වාර්තා මගින් දිගින් දිගටම පෙන්වා දී තිබුණි. ඇතැම් මගීන් වර්ෂයකට 90 වතාවකටත් වඩා මෙලෙස වාණිජ පරමාර්ථයෙන් භාණ්ඩ රැගෙන ඒම සඳහා විදේශ ගමන්වල නිරතව තිබූ අවස්ථා පැවති අතර 2016 වර්ෂය තුලදී ගුවන් මගීන් 60 දෙනෙකු විසින් අවස්ථා 1533 කදී මෙලෙස වාණිජ පරමාර්ථයෙන් භාණ්ඩ රැගෙන විත් තිබුණි. මෙම තත්ත්වය අධෛර්යමත්

නොකිරීමෙන් බදු ආදායම අහිමිවීමක් මෙන්ම වෙළඳපොලේ බදු ගෙවා සාධාරණ පදනමකින් ව්‍යාපාර කටයුතු වල නිරත වන ව්‍යාපාරිකයන් අධෛර්යමත් විය හැකි බවත් නිරීක්ෂණය විය.

(ඈ) ශ්‍රී ලංකා රේගුව විසින් රු.859,500 ක් වැයකර මිලදී ගෙන තිබුණු ඇඟිලි සළකුණු යන්ත්‍ර 07 ක් මේ වන විටත් අස්ථානගත වී තිබුණි.

## 3.18 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල තුල සහ කොළඹ වරාය තුල පවත්වාගෙන යනු ලබන තීරු බදු නිදහස් මත්පැන් වෙළඳ සැල්වල කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව විසින් සිදු කර ඇති අධීක්ෂණ කටයුතුවල පැවති දුර්වලතා පිළිබඳව ඉකුත් විගණන වාර්තා හා විගණන විමසුම්වලින් දිගින් දිගටම පෙන්වා දී තිබුණි. කොළඹ වරාය තුල පිහිටි එක් තීරු බදු නිදහස් වෙළඳසැලක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුල සිදුකල විගණන පරීක්ෂාවේදී තවදුරටත් නිරීක්ෂණය වූ එවැනි අඩුපාඩු කිහිපයක් පහත දැක්වේ.

(i) විකුණුම් ඉන්වොයිසි නිකුත් නොකර මත්පැන් නිකුත් කර තිබුණි.

(ii) විදේශිකයන්ට හෝ නෞකා කාර්ය මණ්ඩලයට හැර වෙනත් පාර්ශවයන් වෙත මත්පැන් අලෙවි කිරීම වළක්වාලීමේ ශක්තිමත් ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි.

(iii) මත්පැන් ගබඩාකර ඇති බැඳි ගුදමේ සිට තීරු බදු නිදහස් වෙළඳසැල තෙක් මත්පැන් ප්‍රවාහනය කිරීම රේගු නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදු විය යුතු වුවත්, එසේ අධීක්ෂණයකින් තොරව මත්පැන් ප්‍රවාහනය කර තිබූ අවස්ථා තිබුණි.

(iv) නෞකා කපිතාන්වරයෙකුගේ ඉල්ලීම මත ආගමන විගමන කාර්යාලය විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් පදනම් කරගෙන මත්පැන් නිකුත් කිරීමෙන් පසුව, එම අවසර පත්‍රය අවලංගු කිරීමට කිසිදු පාර්ශවයක් ඉදිරිපත් නොවීම හා එම බලපත්‍රය පදනම් කරගෙන නැවත නැවතත් මත්පැන් මිලදී ගැනීමේ හැකියාවක් පැවතුණි.

(v) රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව රේගු බැඳි ගුදම් තුල සහ තීරු බදු නිදහස් වෙළඳසැල්වල පවත්වාගෙන යා යුතු ආරක්ෂක (CCTV) කැමරා පද්ධතීන් අක්‍රිය වී තිබුණි.

(vi) චොක්ලට්, සුවඳ විලවුන් හා සිගරට් යන භාණ්ඩද තීරු බදු නිදහස් මත්පැන් වෙළඳසැල්වල අලෙවිකරනු ලබන අතර එම භාණ්ඩ සඳහාද පිටපත් 4 කින් යුත් ඉන්වොයිසි පිළියෙල නොකර තිබුණි.

(v) තීරු බදු නිදහස් වෙළඳසැල් පාලනය සඳහා විධිමත් චක්‍රලේඛ උපදෙස් ලබාදී නොතිබීම හා ගිවිසුම්වල කොන්දේසි හා නියමයන් යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ නියමිත ප්‍රමිතියට අනුකූලව පවතින්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් විවිධ ආයතනවලින් සහතික ලබාගනී. එම සහතික ලැබෙන තෙක් ආනයනික භාණ්ඩ ආනයනකරුවන්ගේ පරිශ්‍රයන් වෙත මුදා හැරීමට ශ්‍රී ලංකා රේගුව විසින් කටයුතු කර ඇති අවස්ථා පැවතියද එම සහතිකය ලැබෙන තෙක් අදාල භාණ්ඩ පරිභෝජනයට යොදා ගැනීමට හෝ වෙළඳපොලට නිකුත් කිරීමට කටයුතු කර ඇත්දැයි පරීක්ෂා කිරීමේ විධිමත් ක්‍රමවේදයක් ශ්‍රී ලංකා රේගුව විසින් අනුගමනය කර නොතිබුණි. මේ පිළිබඳව නියැදි විගණනයට ලක්කල අවස්ථා 1200 කින් අවස්ථා 937 කදීම එසේ රේගු අධීක්ෂණයට ලක් වී ඇති බවක් හෝ පසු විපරම් කටයුතු සිදු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

තවද පෞද්ගලික ඇපකර මත ආනයනකරුවන්ට නිදහස් කරනු ලබන මෙම භාණ්ඩ සඳහා වූ ඇපකර නිදහස් කිරීමට පෙර නැවත ඔවුන් වෙතම ආනයනික භාණ්ඩ නිකුත් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. මේ ආකාරයෙන් කලින් ලබාගන්නා ලද පෞද්ගලික ඇපකර නිදහස් කර

නොතිබියදී රු.මිලියන 241 ක් වටිනා භාණ්ඩ නැවත පෞද්ගලික ඇපකර මත නිදහස් කර තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂා වලදී නිරීක්ෂණය විය.

(ඈ) ශ්‍රී ලංකා රේගුවේ වැටුප් ගෙවීම් සම්බන්ධව යොදා ඇති අභ්‍යන්තර පාලන දුර්වලතා හේතුවෙන් වැටුප් රහිතව විදේශ ගතවූ නිලධාරී දෙදෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු.297,356 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.කෙසේ වුවද මෙම මුදල නැවත අයකර ගෙන ඇතිබව ගණන්දීමේ නිලධාරී විසින් විගණනයට වාර්තා කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා රේගුවේ අතිකාල වියදම රු.මිලියන 567.09 ක් විය. අතිකාල සේවයේ යෙදවීම හා ගෙවීම සම්බන්ධව ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ඉතාම දුර්වල මට්ටමක පැවති අතර එම නිසා අතිකාල ලේඛනයේ අත්සන් කළ පමණින් අතිකාල හිමිකම් ලබා ගැනීමට නිලධාරීන්ට අවස්ථාව සැලසී තිබුණි. මෙම අභ්‍යන්තර පාලන දුර්වලතා පිළිබඳව වර්ෂ ගණනාවක සිට විගණන විමසුම් හා විගණන වාර්තා මගින් පෙන්වා දී තිබුණද මෙම ක්‍රමවේද විධිමත් කිරීම සඳහා කිසිදු පියවරක් මෙතෙක් ගෙන නොතිබුණි.

(ඉ) තැපැල් රේගු කාර්යාලයට අනුයුක්තව සිටින රේගු පරීක්ෂක නිලධාරීන් හා මධ්‍යම තැපැල් හුවමාරු රේගු කාර්යාලයෙහි තක්සේරු අංශය තුල සේවයේ නියුතු රේගු පරීක්ෂක නිලධාරීන් අධිවේගී තැපැල් අංශයට අදාල අතිකාල ලේඛනයේ අත්සන් යොදමින් එම අංශයෙන් අදාල අතිකාල දීමනා ලබාගන්නා බව නිරීක්ෂණය විය.

**3.19 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 329 | 281 | 48 |
| (ii) | ද්විතීයික මට්ටම | 987 | 593 | 394 |
| (iii) | තෘතියික මට්ටම | 1152 | 865 | 287 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 505 | 429 | 76 |
| | එකතුව | 2973 | 2168 | 805 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආනයනික භාණ්ඩ මගින් රාජ්‍ය ආදායමට සැලකිය යුතු දායකත්වයක් සිදු කරනු ලැබුවද, ශ්‍රී ලංකා රේගුව විසින් ආනයනික භාණ්ඩ ඇතුළත් බහාළුම් පරීක්ෂා කිරීමේ කටයුතු විධිමත්ව හා ප්‍රමාණවත්ව සිදු කිරීම සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් යෙදිය යුතු වුවද, එසේ සිදු කර නොතිබෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකා රේගුවේ එක් එක් අංශ වෙත අනුයුක්ත කර ඇති නිලධාරීන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලේඛනයක් මානව සම්පත් කළමනාකරණ අංශය විසින් හෝ පාලන අංශය විසින් නඩත්තු කර නොතිබුණු බැවින් ඒ ඒ අංශවල අවශ්‍යතාවයන්ට අනුකූල වන අයුරින් නිලධාරීන් අනුයුක්ත කර තිබුණු බව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) පල්ලේකැලේ, හොරණ හා මීරිගම පිහිටි අපනයන සැකසුම් කළාපවලට සහ දික්ඕවිට මත්ස්‍ය වරායෙහි රේගු නිවාරණ කටයුතු සිදු කිරීම සඳහා මෙම වාර්තාවේ දිනය වන විටත් නිලධාරීන් අනුයුක්ත කර නොතිබුණි. එසේම නිලධාරීන් විසින් පරීක්ෂා කල නැව් භාණ්ඩ සඳහා වෙනත් අභ්‍යන්තර සුපරීක්ෂකවරු නොවීය.